**තෙවන වාර පරීක්ෂණය 2020** — **11 ශ්‍රේණිය**
**மூன்றாம் தவணைப் பரீட்சை 2020** — **தரம் 11**
**Third Term Test 2020** — **Grade 11**

| | |
|---|---|
| නර්තනය (දේශිය) I<br>Dancing Oriyantal I<br>நர்த்தனம் (தேசிய) I | කාලය පැය 3.00<br>Time 3.00 hours<br>3.00 மணித்தியாலம் |

නම / විභාග අංකය - ....................................................................................................................

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 10 තෙක් ප්‍රශ්න වල හිස්තැන් වලට සුදුසු වචන තෝරන්න.**

1. ජීවන වෘත්තීන් හා බැඳි ක්‍රියාකාරකම් ඇසුරින් .................... , ..................... හා ................... නර්තනාංග බිහිවිය.

   i. ධීවර, පතල්, ලී කෙළි　　ii. ගොයම්, චාමර ,පන්
   iii. කෘෂි, ධීවර, මැටි　　iv. හටන්, රබන්, ගොයම්

2. රාජ සභාව ඇසුරෙහි පැවති නර්තනාංග ලෙස ......................... , ........................... හැඳින්විය හැකිය.

   i. රබන්, ලී කෙළි　　ii. රබන්, චාමර　　iii. චාමර, කළගෙඩි　　iv. ලී කෙළි, කුළු

3. "අද්භූත"රසය උපදින්නේ ............................... නමැති භාවයෙනි.

   i. විස්මය　　ii. ශම　　iii. උත්සාහ　　iv. ශෝක

4. ........................... යනු උඩරට නර්තන සම්ප්‍රදායේ එකොළොස්වන ගොඩ සරඹය යි.

   i. චන්ද්‍රිකා සරඹය　　ii. බඹර සරඹය　　iii. පැනීමේ සරඹය　　iv. දෑත පෑගීමේ සරඹය

5. මනිපුරි සම්ප්‍රදායේ බෙර පැළඳ නර්තනයේ යෙදෙනු ලබන්නේ ....................... නර්තනාංගයේ දී ය.

   i. චෙංගිලම්　　ii. පුං චොලම්　　iii. මද්දලම්　　iv. කණ්ඩිල

6. "නාට්‍ය ශාස්ත්‍රය" රචනා කරන ලද්දේ ......................... නම් පඬිවරයා ය.

   i. භරතමුණි　　ii. අභිනව ගුප්ත　　iii. නන්දි කේශ්වරී　　iv. උදය ශංකර්

7. සතර අභිනයන් ඇසුරෙන් රංග වස්ත්‍රාභරණ ......................... අභිනයට අයත් වේ.

   i. ආංගික　　ii. වාචික　　iii. සාත්වික　　iv. ආහාර්ය

8. "හනික වරෙව් කොල්ලනේ........." යන ගීතය ...................... නාට්‍යයේ ගීතයකි.

   i. බෙරහඬ　　ii. විදුර　　iii. නරි බෑනා　　iv. ශ්‍රී වික්‍රම

9. රති හා ක්‍රෝධ යන භාවයන් තුලින් ජනිත වන්නේ ....................... හා .........................

   i. ශෘංගාර හා රෞද්‍ර රසයන් ය　　ii. කරුණා හා හාස්‍ය රසයන් ය
   iii. ශෘංගාර හා අද්භූත රසයන් ය　　iv. වීර හා රෞද්‍ර රසයන් ය

10. සබරගමු නර්තනයේ දොඹින පද පහතරට නර්තනයේ .......................... වේ.

i. ඉලංගම් සරඹ ii. මණ්ඩි පද iii. ගොඩ සරඹ iv. පා සරඹ

11. කථකලි නර්ථනයේ ප්‍රධාන ගායකයා හා අනු ගායකයා හඳුන්වනු ලබන්නේ.

1. පොන්නානි හා සිංකිටි ලෙස ය 2. පොන්නානි හා වඩිවේලු ලෙස ය

3. වඩිවේලු හා ශිවනාදන් ලෙස ය 4. ශිවනාදන් හා පොන්නානි ලෙසය

12. කවි පදයක් ගායනා කිරීමේ දී ඊට හිමි වන මාත්‍රා ගණන හඳුන්වනු ලබන්නේ.

1. සදැස් මාත්‍රා 2. ලඝු මාත්‍රා 3. ගුරු මාත්‍රා 4. ගී මාත්‍රා

13. බෙර වාදනයට දැත් හුරු කරගන්නා ආධුනික ශිල්පියා මූලිකවම පුහුණු විය යුත්තේ.

1. බෙර සරඹ යි 2. බෙර පද යි 3. දේව පද යි 4. අලංකාර පද යි

14. කොහොඹා කංකාරියේ පූර්ව චාරිත්‍ර දෙකකි.

1. අගහස් වෙන් කිරීම, මුරුතැන් පිදීම 2. කප් සිටුවීම, මුරුතැන් පිදීම

3. අක්යාල වෙන් කිරීම, කප් සිටුවීම 4. මුරුතැන් පිදීම, කඩවර ගොටු පිදීම

15. කෝල් පාඩුව හා දේව කෝල් පාඩුව නර්තනය කරනුයේ.

1. කොහොඹා කංකාරියේ හා දෙවොල් මඩුවෙ ය

2. කොහොඹා කංකාරියේ හා පහන් මඩුවෙ ය

3. පහන් මඩුවෙ හා දෙවොල් මඩුවෙ ය

4. පහන් මඩුවෙ හා කොහොඹා කංකාරියේ ය

අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත රූප සටහන් උපයෝගී කරගන්න.


A


B


C



D

16. සොකරි කෝලම් නාට්‍ය වල අවස්ථා දැක්වෙනු යේ

i. A හා B රූප වලය ii. B හා C රූප වලය

iii. D හා C රූප වලය iv. B හා D රූප වලය

17. "සතුරාට වුවද විපතකදී පිහිට වීමේ ගුණය" පිළිබඳ කියැවෙන නාට්‍ය දැක්වෙන වරණය

i. A ය ii. B ය iii. C ය iv. D ය

18. වජිරා චිත්‍රසේන මහත්මිය ප්‍රධාන කාන්තා චරිතය නිරූපණය කරන නාට්‍ය අයත් වරණය

i. A ය ii. B ය iii. C ය iv. D ය

19. දකුණු මුහුදුබඩ තීරයේ වඩාත් ප්‍රචලිත නාට්‍ය සම්ප්‍රදාය දැක්වෙන්නේ

i. A රූපයේ ii. B රූපයේ iii. C රූපයේ iv. D රූපයේ

20. රංග වස්ත්‍ර නිර්මාණය සඳහා පිළිවෙලින් සෝමබන්දු විද්‍යාපති මහතා මහේෂ් උමගලිය සම්බන්ධ නාට්‍ය දැක්වෙන වරණ

i. D හා A ය　　ii. B හා C ය　　iii. A හා B ය　　iv. B හා A ය

21. සරල බවේ සිට සංකීර්ණ බව දක්වා ක්‍රමයෙන් වර්ධනය වන අයුරින් නිර්මාණය වී ඇති ශාස්ත්‍රීය නර්තන විශේෂයකි

i. වට්ටම්　　ii. හත් පද　　iii. වන්නම්　　iv. අලංකාර පද

22. කර්ණාටක සංගීත සම්ප්‍රදාය යොදා ගන්නා නර්තන සම්ප්‍රදායන් වනුයේ

i. භරත හා කතක්　　ii. කතක් හා කථකලි

iii. කථකලි හා මනිපුරි　　iv. භරත හා කථකලි

23. උඩරට නැටුම් කලාව හා භාරතීය සම්භාව්‍ය නර්තන කලාව යන කෘති රචනා කරන ලද්දේ

i. මුදියන්සේ දිසානායක මහතා හා ජයසේන කෝට්ටේගොඩ මහතා

ii. ජේ. ඊ. සේදරමන් මහතා හා සිරිමතී රසාදරී මහත්මිය

iii. ජේ. ඊ. සේදරමන් මහතා හා ජයසේන කෝට්ටේගොඩ මහතා

iv. මුදියන්සේ දිසානායක මහතා හා සිරිමතී රසාදරී මහත්මිය

24. විෂ්ණු දෙවියන් උදෙසා රචනා කර ඇති භක්ති කාව්‍ය විශේෂය අයත් වනුයේ

i. උඩරට සම්ප්‍රදායට　　ii. පහතරට සම්ප්‍රදායට

iii. සබරගමු සම්ප්‍රදායට　　iv. ද්‍රවිඩ සම්ප්‍රදායට

25. "ලකල පුළු ලුකුල බැඳි මිණි මෙවුල්ලා .........." මෙම කවිය අයත් ඓතිහාසික මූලාශ්‍රය වන්නේ

i. සංදේශ කාව්‍ය　　ii. වංශ කතා　　iii. දේශාටන වාර්තා　　iv. ලෙන් ලිපි

පහත දැක්වෙන වගුව ඇසුරෙන් අංක 26 සිට 28 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

| | A | B | C |
|---|---|---|---|
| 1 | වීරමුණ්ඩ | සේරමාන් | අස්නේ |
| 2 | පත්තිනි | පඬුවස් දෙව් | වාහල |
| 3 | දෙවොල් | සළඹ | යක් ඇණුම |

26. කොහොඹා කංකාරියේ හා දෙවොල් මඩුවේ උපත් කථාව හා සම්බන්ධ පුද්ගල නාම සඳහන් වන්නේ

i. A තීරුවේ 1 හා 2 පේළි වලය　　ii. B තීරුවේ 1 හා 2 පේළි වලය

iii. B තීරුවේ 1 හා 3 පේළි වලය　　iv. B තීරුවේ 2 හා 1 පේළි වලය

27. උඩරට හා පහතරට ශාන්තිකර්ම හා බැඳි නර්තනාංග සඳහන් වී ඇත්තේ

i. C තීරුවේ 1 හා 2 පේළිවලය　　ii. C තීරුවේ 1 හා 3 පේළිවලය

iii. B තීරුවේ 3 හා C තීරුවේ 3 පේළිවලය　　iv. A තීරුවේ 2 හා 3 පේළිවලය

28. A තීරුවේ 1, 2, 3 පේළිවල දැක්වෙනුයේ

i. කොහොඹා කංකාරියේ උපත් කථාව හා සම්බන්ධ චරිතය
ii. පහන් මඩුවේ පුද ලබන දෙවිවරුය
iii. ශාන්තිකර්ම ත්‍රිත්වයේම පුද ලබන දෙවිවරුය
iv. දෙවොල් මඩුවෙ උපත් කථාවේ චරිතය

29. මනිපුරි නර්තන සම්ප්‍රදායේ රංගවස්ත්‍ර වන කුමින් හා මයිකුම් පළඳිනු ලබන්නේ පිළිවෙලින්

i. හිසට හා ඉනටය
ii. ඉඟටිය හා හිසටය
iii. දෑතට හා කණටය
iv. හිසට හා උඩුකයටය

30. මනිපුරි නර්තනය ව්‍යාප්ත කිරීමට මහත් උත්සාහයක් දැරූ තැනැත්තෙකි

i. ශ්‍රීමතී රුක්මණී දේවි අරුන්ඩේල්
ii. ශ්‍රීමතී මේනකා
iii. මහා කවි වල්ලතෝල් නාරායන මෙනන්
iv. මහාකවි රවින්ද්‍රනාත් තාගෝර්

## II කොටස - උඩරට සම්ප්‍රදාය

31. "පසු පෙර අඩිය" ලෙස හඳුන්වන්නේ

i. 6 වන පා සරඹය
ii. 5 වන පා සරඹය
iii. 6 වන ගොඩ සරඹය
iv. 4 වන ගොඩ සරඹය

32. අට වන ගොඩ සරඹය හඳුන්වන නාමය වන්නේ

i. බඹර සරඹය    ii. දෙපැති සරඹය    iii. අර්ධ චක්‍ර සරඹය    iv. අංගහාර සරඹය

33. "දොං ජිංත ගත දොංත" බෙර පදය වාදනය කල හැක්කේ

i. මාත්‍රා 2+4 දෙතිතටය
ii. මාත්‍රා 2+3 දෙතිතටය
iii. මාත්‍රා 2+2 දෙතිතටය
iv. මාත්‍රා 3+4 දෙතිතටය

34. මෙම ඡායාරූපයෙන් දැක්වෙන්නේ



i. චිත්‍රසේන මහතා ය
ii. තිත්තවෙල ගුණයා මහතා ය
iii. ජේ. ඊ. සේදරමන් මහතා ය
iv. පණිභාරත මහතා ය

35. "කුදාංත ගත ගත දොං" වට්ටමේ තාල රූපය වන්නේ

i. දෙසුළු මහ තුන්තිත ය
ii. දෙසුළු මැදුම් තුන්තිත ය
iii. සුළු මැදුම් දෙතිත ය
iv. සුළු මහ දෙතිත ය

36. පිළිවෙලින් උඩරට පහතරට සබරගමු සම්ප්‍රධායන්ගේ වන්නම් ගණන වන්නේ

i. 18, 21, 32    ii. 32, 21, 18    iii. 18, 32, 21    iv. 21, 32, 18

37. තාල රූප දෙකකට ගායනා කරනු ලබන උඩරට වන්නමක් වන්නේ

i. සැවුලා ii. මුසලඩි iii. නෛයඩි iv. සිංහරාජ

38. "සැපත පැමිණි මුළු ලොවට සියල්ලේ ............" මෙම කවි පදය අයත් වන්නේ

i. උඩරට සම්ප්‍රදායට අයත් පන්තේරු කවි වලටය

ii. පහතරට සම්ප්‍රදායට අයත් ග්‍රහපන්ති කවි වලටය

iii. සබරගමු සම්ප්‍රදායට අයත් පන්තේරු කවි වලටය

iv. උඩරට සම්ප්‍රදායට අයත් ග්‍රහපන්ති කවි වලටය

39. උඩරට වෙස් ඇඳුම් කට්ටලයේ ඇති ආභරණ කිහිපයකි

i. වෙස් තට්ටුව, අවුල් හැරය, පායින්පත

ii. වෙස් තට්ටුව, නළල් පටිය, රහු කුට්ටම

iii. සිඛා බන්ධනය, නළල් පටිය, තෙල් කච්චිය

iv. අවුල් හැරය, රහු කුට්ටම, ගෙජ්ජි

40. "තත් තොග ............ තක්කඩ තරිකිට ................" යන අඩව්වේ හිස්තැන් සඳහා නියමිත පද කොටස් වන්නේ

i. තක තොග, තක්කඩ ii. තක තක, තොගතක

iii. තොග තක, තා කුජිත්ත iv. තක තොග, තක තොග

## III කොටස - පහතරට නර්තනය

31. පහතරට නර්තනය ප්‍රචලිත ප්‍රදේශ ලෙස සැලකෙන්නේ

i. මාතර, බෙන්තර, රයිගම ii. මාතර, බෙන්තර, මහනුවර

iii. කළුතර, බෙන්තර, රත්නපුර iv. කළුතර, බෙන්තර, බලංගොඩ

32. අටවන ඉලංගම් සරඹය කුමක්ද

i. දොම් තරිකිට ii. ගඳිතම් ගත iii. ගුං දැහිම් iv. ගුද ගඳි කිට

33. ගුං දෙගත ගත්ත ගුං යන බෙරපදය අයත් වන්නේ

i. මාත්‍රා 12+1234 දෙතිතටය ii. මාත්‍රා 12+123 දෙතිතටය

iii. මාත්‍රා 123+1234 දෙතිතටය iv මාත්‍රා 12+1234 දෙතිතටය

34. පහතරට ශාන්ති කර්ම සාහිත්‍ය කෘතිය රචනා කරන ලද්දේ

i. මහාචාර්ය ආරියරත්න කලුආරච්චි ii. මහාචාර්ය ලයනල් බෙන්තරගේ

iii. මහාචාර්ය තිස්ස කාරියවසම් iv. මහාචාර්ය ජයසේන කෝට්ටෙගොඩ

35. ගුද ගතිගත වට්ටමේ තාල රූපය වන්නේ

i. සුළු තනි තිත ii. මැදුම් තනිතිත

iii. මහ තනිතිත iv. මැදුම් මහ දෙතිත

36. පිළිවෙලින් උඩරට පහතරට සබරගමු සම්ප්‍රදායන්ගේ වන්නම් ගණන වන්නේ

i. 18- 21 -32 ii. 32-21-18 iii. 18-32-21 iv. 21 -32-18

37. පහතරට සින්දු වන්නමකට අයත් කොටස් ගණන

i. පහකි ii. හතරකි iii. හයකි iv. හතකි

38. දෙවොල් මඩුවේ පුද ලබන ප්‍රධාන දෙවිවරුන් වන්නේ

i. පත්තිනි හා දෙවොල් දෙවි ii. මංගර දෙවි හා වාහල දෙවි
iii. දෙවොල් දෙවි හා වීරමුණ්ඩ දෙවි iv. දෙවොල් දෙවි හා සමන් දෙවි

39. පහතරට දෙවොල් ඇඳුම් කට්ටලයට අයත් ආභරණ කීපයකි

i. හැට්ටය, රැළි සාය හා කාගුල් ii. හැට්ටය, රැළි සාය හා වෙස් තට්ටුව
iii. හේලය, පච්චවඩම හා රැළි සාය iv. හේලය, පච්චවඩම හා හස්තකඩය

40. රෙගුද ------------ ගත --------- රෙගුදක දොම් යන ඉරට්ටියේ හිස් තැන් සඳහා නියමිත පද කොටස වන්නේ

i. ගදිත - ගදිංත දිත ii. ගදිත්ත - ගදිත්ත iii. රෙගුද - ගත්තත් iv. ගදිත - ගුදි

## IV කොටස - සබරගමු නර්තනය

31. සබරගමු නර්තනය ප්‍රචලිත ප්‍රදේශ ලෙස සැලකෙන්නේ

i. රත්නපුර, බලංගොඩ, කලවාන ii. රත්නපුර, බලංගොඩ, මහනුවර
iii. කළුතර, බෙන්තර, රත්නපුර iv. කළුතර, බෙන්තර, බලංගොඩ

32. දහවන දොඹින පදය කුමක්ද

i. කරතත් තත්කිට ii. තෙයියත් තා දොම්
iii. කිත්තක් කිත්තක් ජෙජ් ජෙංතා iv. කිට තරිකිට ගතත්ත

33. ජිං ජිමිත තත් තකට යන බෙරපදය අයත් වන්නේ

i. මාත්‍රා 12+1234 දෙතිතටය ii. මාත්‍රා 12+123 දෙතිතටය
iii. මාත්‍රා 123+1234 දෙතිතටය iv. මාත්‍රා 12+1234 දෙතිතටය

34. සමන් දේවාල පුද සිරිත් කෘතිය රචනා කරන ලද්දේ

i. මහාචාර්ය ආරියරත්න කලුආරච්චි ii. මහාචාර්ය ලයනල් බෙන්තරගේ
iii. මහාචාර්ය තිස්ස කාරියවසම් iv. මහාචාර්ය ශ්‍රියාණි රාජපක්ෂ

35. ගමන් මාත්‍රයේ තාල රූපය වන්නේ

i. මැදුම් තනි තිත ii. සුළු තනිතිත
iii. මහ තනිතිත iv. මැදුම් මහ දෙතිත

36. පිළිවෙලින් උඩරට පහතරට සබරගමු සම්ප්‍රදායන්ගේ වන්නම් ගණන වන්නේ

i. 18- 21 -32 ii. 32-21-18 iii. 18-32-21 iv. 21 -32-18

37. සබරගමු වන්නමකට අයත් කොටස් ගණන

i.හතරකි ii. පහකි iii. හයකි 4.හතකි

38. පහන් මඩුවේ පුද ලබන ප්‍රධාන දෙවි වරුන් වන්නේ

i. පත්තිනි හා දෙවොල් දෙවි ii. මංගර දෙවි හා වාහල දෙවි

iii. දෙවොල් දෙවි හා වීරමුණ්ඩ දෙවි iv. දෙවොල් දෙවි හා සමන් දෙවි

39. සබරගමු දෙවොල් ඇඳුම් කට්ටලයට අයත් ආභරණ කීපයකි

i. හේලය, හැට්ටය හා කාගුල් ii.හැට්ටය, රැළි සාය හා වෙස් තට්ටුව

iii. හේලය, පච්චවඩම හා රැළි සාය iv. හේලය, පච්චවඩම හා හස්තකඩය

40. තාත් ------------ තකට --------- කිනම් තත් ජිත් යන අඩව්වේ හිස් තැන් සඳහා නියමිත පද කොටස වන්නේ

i. ගදිත - ගදිංත දිත ii. තත් ජිත් - ගදිත්ත

iii. තත් - ගත්තත් iv. තත් ජිත් - තත් ජිත්